

## ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිපල

පාරිසරික සංවේදී ප්‍රදේශ සම්බන්ධව ජාතික ප්‍රතිපත්තියක් හා උපාය මාර්ග සකස් කිරීම

ජෛව විවිධත්ව සංරක්ෂණය වැඩිදියුණු කරන අතරම තිරසර සංවර්ධනයට සහාය වීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශ වල ජනතාව සඳහා පරිසර හිතකාමී හා තිරසර ජීවනෝපායන් හඳුන්වා දීම මඟින් ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම

ශ්‍රී ලංකාවේ පාරිසරික සංවේදී ප්‍රදේශ සම්බන්ධව ඇති අවබෝධය වැඩි දියුණු කිරීම

නව භූමි භාවිත පාලන රාමුවක් සැකසීම

පාරිසරික සංවේදී කලාප කළමනාකරණය පිළිබඳ රාජ්‍ය සේවකයින් හා දේශීය ප්‍රජාවගේ හැකියාවන් හා ධාරිතාව වර්ධනය කිරීම

ප්‍රජා මූල සංවිධාන, සිවිල් සමාජ සංවිධාන, පර්යේෂණ ආයතන හා පුද්ගලික හා රාජ්‍ය ආයතන ඇතුළත්ව පාර්ශවකරුවන් අතර සහයෝගීතාව වර්ධනය

සංරක්ෂණය හා දේශීය ජනතාවගේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා භූමියේ අගය එකතු කළ පරිසර පද්ධති කළමණාකරණය ඒකාබද්ධ කිරීම

මිනිසා හා වන ජීවීන් අතර ඇති ගැටුම් වලට විසඳුම් ලබා දිය හැකි ජාතික ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම





## Sri Lanka Next
## නීල හරිත යුගයක් කරා...


ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ගේ දිගු කාලීන පරිසර සංරක්ෂණ ප්‍රතිපත්තිය යටතේ, නියමු ව්‍යාපෘතියක් ලෙස කලා ඔය ද්‍රෝණිය ආශ්‍රිතව පරිසර සංවේදී ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් 2015 වසරේ ඔක්තෝම්බර් පළවන දින ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය වසර පහක් පුරා ක්‍රියාවට නැංවේ.

මෙහිදී සංරක්ෂිත ප්‍රදේශ ලෙස ප්‍රකාශිත ප්‍රදේශයන්ට පිටතින් පවතින, පරිසර පද්ධති සේවාවන් හා ජෛව විවිධත්වය අතින් අතිශයින් වැදගත්කමකින් යුතු පාරිසරික සංවේදී කලාපය කළමනාකරණය කිරීම සඳහා ආයතනික හා නීතිමය රාමුවක් සහ මාර්ගෝපදේශයක් ඇතුළත්ව ජාතික මට්ටමින් පාරිසරික සංවේදී ප්‍රදේශ කළමනාකරණය සඳහා අවශ්‍ය පාලන රාමුවක් ඇති කෙරේ. ඒ හරහා රාජ්‍ය, රාජ්‍ය නොවන, පෞද්ගලික අංශය සහ ප්‍රජාව සවිබල ගන්වා පරිසර සංවේදී ප්‍රදේශ කළමනාකරණයේ කොටස්කරුවන් බවට ඔවුන් පත් කරන අතරම, ආරක්ෂිත ප්‍රදේශ හා පරිසර සංවේදී ප්‍රදේශ ආශ්‍රිත තිරසර සමාජ - ආර්ථික සංවර්ධනයක ප්‍රතිලාභ ලබා කර ගැනීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

පරිසර පද්ධති සේවාවන් හා ජෛව විවිධත්වය පිළිබඳ දත්තයන් අන්තර්ග්‍රහනය කළ භූ දර්ශ හා සාගර දර්ශ පදනම් කර ගත් ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීමත්, ඒ මත පදනම්ව කෘෂිකාර්මික, ධීවර, සංචාරක යනාදී අංශ ඔස්සේ ආංශික සැලසුම් පිළියෙල කිරීමත්, ක්‍රියාත්මක කිරීමත් ඇතුළු ක්‍රියාකාරකම් රැසක් මේ හරහා සිදුකෙරේ.

ඒ අනුව පරිසර පද්ධති කළමනාකරණය සමඟ සංවර්ධනය අනුප්‍රවාහගත කිරීම මඟින් ශ්‍රී ලංකාව තුළ දිගු කාලීනව තිරසර සංවර්ධනය තහවුරු කර ගැනීමට මෙම ව්‍යාපෘතිය හරහා මූලික පදනම සැලසෙනු ඇත.එසේම මෙම ව්‍යාපෘතියේ අත්දැකීම් ශ්‍රී ලංකාවේ අනෙකුත් පාරිසරික සංවේදී කලාපයන් සඳහා ඉදිරියේදී යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

# සුරැකෙන රටක්
# තිරසර හෙටක්




## පාරිසරික සංවේදී භූමි ප්‍රදේශ වල ජෛව විවිධත්ව සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තුව

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

## ජෛව විවිධත්වය සහ ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාවේ භූමිය මෙන්ම මුහුදු සීමාවද ලෝකයේ අවධානයට පාත්‍ර වූ අතිශයින් වැදගත් ඉහළ ජෛව විවිධත්වයකින් යුක්ත ප්‍රදේශයකි.

මෙම ජෛව විවිධත්වය සහ පරිසර පද්ධතීන්ගේ ආරක්ෂාව පිණිස විවිධ සංරක්ෂිත කලාප රැසක් ප්‍රකාශයට පත් කර තිබේ. ඒ සඳහා සුවිශේෂී නීති පද්ධතියක්ද හඳුන්වා දී ඇත.

නමුත් පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා එය ප්‍රමානවත් වී නොමැත. එබැවින් සංරක්ෂිත කලාප තුළ මෙන්ම ඉන් පිටත පරිසරයටද නිතිපතා බරපතල ලෙස හානි සිදු වේ.

මෙම තත්වය වළක්වා ගැනීම පිණිස පරිසර හිතකාමී නව උපාය මාර්ග සහ සැලසුම් සකස් කළ යුතුය. පරිසරයට හානි කරමින් තම ජීවනෝපාය සලසා ගන්නා සාමාන්‍ය ජනතාවගේ ජීවනෝපාය මාර්ගද, නිවාස අවශ්‍යතාවයන්ද ඉටුවන යථාර්ථවාදී පරිසර සංරක්ෂණ ප්‍රවේශයන් වෙත යොමු විය යුතුය.

## පරිසර සංවේදී කලාප

පරිසර සංවේදී කලාප පිහිටුවීමේ නව ව්‍යාපෘතිය සකස් කරන ලද්දේ උක්ත කරුණ සාක්ෂාත් කර ගැනීම උදෙසාය.

මෙමගින් නව ඉඩම් භාවිත ප්‍රතිපත්තියක් අනුගමන කෙරේ. ඒ යටතේ විශේෂ පාරිසරික සංවේදී කලාප ස්ථාපිත කෙරෙනු ඇත. එම සංරක්ෂිත කලාප තුළ මෙන්ම ඉන් පිටත ජෛව විවිධත්වය සුරැකීම සිදු වනු ඇත. ඒ සඳහා මෙම කලාප තුළ දැඩි සංරක්ෂිත ක්‍රමවේදයන් භාවිත කෙරේ. ඒ තුළ ඇති භූමිය බහුවිධ කටයුතු සඳහා යොදා ගනු ලබන්නෙ ලෝකයේ අවධානයට පාත්‍ර වූ සුවිශේෂී ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සඳහා නව උපාය මාර්ගය අනුගමනය කරමිනි.

පරිසරයද ආරක්ෂා කර ගනිමින්, මෙම කලාප තුළ ජීවත් වන ජනතාව එහි කොටස් කරුවන් බවට පත් කරමින්, ඔවුනගේ ජීවනෝපාය මාර්ගද ආරක්ෂා කිරීම මෙහි ඇති විශේෂත්වයයි. මෙම නියමු ව්‍යාපෘතිය කලා ඔය ද්‍රෝණිය කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

## කලා ඔය ද්‍රෝණිය

කලා ඔය ද්‍රෝණිය ශ්‍රී ලංකාවේ ගංගා ද්‍රෝණි 103 අතරින් එකකි. දළ වශයෙන් කි.මී 25 පමණ පළලකින් යුත් මෙහි දිග කි.මී. 150 පමණ වේ. කලා ඔය ද්‍රෝණියට අයත් භූමියෙන් 76% පුළුල් පරාසයක් වයඹ පළාතේ පිහිටා තිබේ. මුහුදු මට්ටමේ සිට මීටර 600 පරාසයක් දක්වා විවිධ උස මට්ටම් හී පැතිර ඇති මේ ද්‍රෝණිය ශ්‍රී ලංකාව සතු මුහුදු සීමාව දක්වා පැතිර තිබීම විශේෂිතය. මේ වපසරිය පුරා කුඩා වැව් 600 පමණ තිබේ. ඉන් කිහිපයක් නටබුන්ය. අනෙක් වැව් යහපත් මට්ටමේ පවතී.

උතුරු මැද, මධ්‍යම හා වයඹ පළාත් ඔස්සේ ගලා බසිනා කලා ඔය ඒ ආශ්‍රිතව ජීවත් වන ශාක හා සතුන් ඇතුලු සමස්ත පරිසර පද්ධතිය පෝෂණය කරයි. කලා ඔය පෝෂණය වනුයේ බෝවතැන්න ජලාශයෙන් මුදා හැරෙන මහවැලි ජලයෙනි.

නව ව්‍යාපෘතිය යටතේ කලා ඔය පරිසර සංවේදී කලාපයට දළ වශයෙන් හෙක්ටයාර 209,700 ක පමණ වපසරියක් ඇතුළත් කිරීමට යෝජිතය. ඒ සඳහා ගොඩබිමින් හෙක්ටයාර 158,700 ක්ද, ශ්‍රී ලංකාව සතු මුහුදෙන් හෙක්ටයාර 51,000 ක්ද අන්තර්ගත කෙරේ.


කලා ඔය ද්‍රෝණියට අයත් ගොඩබිම් ඉඩම් හෙක්ටයාර 158,700 තුළ, කරදිය වගුරු හෙක්ටයාර 250ක්, කඩොලාන පද්ධති හෙක්ටයාර 620, ගංගාශ්‍රිත වනාන්තර හෙක්ටයාර 200 පිහිටා ඇත.

## ව්‍යාපෘති ගම්මාන

මෙම ව්‍යාපෘතිය මූලික වශයෙන් ආරම්භ කිරීම සඳහා ගම්මාන කිහිපයක් තෝරාගෙන ඇත. විල්පත්තුව ප්‍රදේශයේ වනාතවිල්ලුව, කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති ගම්මානද, කලා වැව ප්‍රදේශයේ ඉපලෝගම, කැකිරාව, පළාගල සහ ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨා-සය තුළ ඇති ගම්මානද ඊට ඇතුළත්ය.

මෙහිදී එම ග්‍රාමයන් සඳහා මූලික වශයෙන් පරිසර හිතකාමී ජීවනෝපාය රටාවක් හඳුන්වාදීම සිදු වේ. ඒ වෙනුවෙන් පරිසරය ආරක්ෂා කරමින් ආදායම් ඉපැයීමේ ක්‍රමවේද හඳුන්වා දීම, පරිසර හිතකාමී ගොවිතැන ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රජා වන ව්‍යාපෘති දියත් කිරීමට සැලසුම් කර ඇත.

මෙම ව්‍යාපෘතිය මගින් එම ප්‍රදේශ වල ජීවත් වන ජනතාවට ප්‍රතිලාභ රැසක් හිමි වනු ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම ගම්මාන ප්‍රජාව තම ජීවනෝපායේ කොටසක් ලෙසද, තම ජීවිතයේ අරමුණක් ලෙසද මෙම පාරිසරික සංරක්ෂණ කලාපය ආරක්ෂා කරනු ඇත.




## පාර්ශවකරුවන්

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් පස් අවුරුදු සැලැස්මක් යටතේ ක්‍රියාත්මක කරන පාරිසරික සංවේදී භූමි ප්‍රදේශ වල ජෛව විවිධත්වය සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තු ව්‍යාපෘතිය සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) සහය ලැබෙන අතර, ජගත් පාරිසරික පහසුකම (GEF) මගින් මූල්‍යාධාර සපයනු ලබයි.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය, සහ අනුරාධපුර හා පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වැනි රාජ්‍ය ආයතන පාර්ශවකරුවන් ලෙස ක්‍රියා කරයි. එමෙන්ම රාජ්‍ය නොවන සංවිධාන හා සිවිල් සංවිධාන වල සහය ලැබෙන අතර, ප්‍රදේශවාසීන්ද මෙම ව්‍යාපෘතියේ අනිවාර්ය කොටස්කරුවන් වේ.

ඒ අනුව ජාතික මට්ටමේ සංවර්ධන ව්‍යාපෘති කියාත්මක කිරීමේදී, මෙවැනි පරිසර සංවේදී කලාප හඳුනාගෙන ඒවායේ ජෛව විවිධත්ව සංරක්ෂණය තහවුරු කරමින් තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට මෙවන් ව්‍යාපෘති හරහා මඟ සැලසෙනු ඇත.


පරිසර සැලසුම් සහ ආර්ථික අංශය,
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
980/4, වික්‍රමසිංහ පෙදෙස, ඇතුල් කෝට්ටේ
විමසීම්: දීපාල් සිරිබද්දන, අධ්‍යක්ෂ (පරිසර සැලසුම් සහ ආර්ථික)
ව්‍යාපෘති අධ්‍යක්ෂක ( ESA ව්‍යාපෘතිය)
දුරකථන: 0112 881 726 ෆැක්ස්: 0112 887 027